2025

කාර්යසාධන වාර්තාව

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

<u>2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව</u>
<u>රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව</u>

<u>වැය ශීර්ෂ අංකය: 245</u>

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම:

රටක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී, රාජ්‍ය ආදායම් හා වියදම් ඇතුළු රාජ්‍ය සම්පත් කළමනාකරණය කරන ආකාරය ප්‍රධාන වශයෙන් වැදගත් වන අතර එය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය විෂයයට අදාළ වේ. රජය සතුව පවතින සම්පත් සීමිත වන අතර සමාජ අවශ්‍යතා එයට වඩා විශාල බැවින්, ආර්ථික හානි හා අපතේ යාම් අවම කරමින් රාජ්‍ය සම්පත් හැකි උපරිම ලෙස කාර්යක්ෂමව සහ සඵලදායීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම, රජයේ මුදල් භාවිතයේ විනිවිදභාවය හා වගවීම තහවුරු කරමින් පුරවැසියන්ට වඩාත් ගුණාත්මක සේවාවන් සැපයීමටත්, දිගුකාලීන ආර්ථික ස්ථායීතාවය සහ සාර්ථකත්වය සහතික කිරීමටත්, සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කළ හැකි ලෙස රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාල ක්‍රමවේද, ක්‍රියාවලි සහ ආයතන ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“රාජ්‍ය අංශයේ විනිවිදභාවය, වගවීම, හා සේවා සැපයීම වර්ධනය කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති පද්ධති රාමුවක් සකස් කිරීම”

මෙහෙවර

“රාජ්‍ය අංශය තුල මහජන වගවීමට සහාය වන ආයතනික ක්‍රියාකාරීත්වයක් සහිත පුළුල් යහපාලන පරිසරයක් ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය පද්ධති, පටිපාටීන් සකස්කිරීම, සමාලෝචනය, සංවර්ධනය, පසුවිපරම හා යාවත්කාලීන කිරීම.”

අරමුණු

1. රාජ්‍ය අංශයේ ගණුදෙනුවල විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම පිණිස රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රමපද්ධති හා පටිපාටීන් සැකසීම, සංවර්ධනය, සමාලෝචනය, පසුවිපරම සහ යාවත්කාලීන කිරීම.

2. රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායිව සහ කාර්යක්ෂමව උපයෝජනය කිරීම සහතික කරනු පිණිස රාජ්‍ය ගිණුම් කාරක සභාවට අවශ්‍ය සහාය ලබා දීම සහ රාජ්‍ය අංශයේ යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

3. දැනට පවතින රජයේ ගාස්තු හා අයකිරීම් කටයුතු අධීක්ෂණය, සමාලෝචනය කිරීම සහ පිරිවැය ඵලදායීතාව ඉහළ නංවන අයුරින් බදු නොවන ආදායම් ඉපැයීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම.

4. මහජන මුදල් ඵලදායිව සහ කාර්යක්ෂම ලෙස යෙදවීම සහතික කරනු පිණිස, විවිධ අරමුණු උදෙසා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පිහිටුවා ඇති අරමුදල් භාවිතය විධිමත් කිරීම, අරමුදල් කටයුතු සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්:

i. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සමාලෝචනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.

ii. රාජ්‍ය ආයතනවල කාර්යයන් පරීක්ෂා කිරීමේදී රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වීම සහ භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම ඇතුළු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.

iii. විගණකාධිපතිවරයාගේ වාර්තා සහ විගණන විමසුම් අනුව පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.

iv. දෙපාර්තමේන්තු ගාස්තු සහ අයකිරීම් සමාලෝචනය කර අවශ්‍ය විට සංශෝධන යෝජනා කිරීම.

v. මුදල් රෙගුලාසි 104 සහ 113 ප්‍රකාරව කපා හැරීම් සහ අත්හැරීම් සඳහා වන ඉල්ලීම් පරීක්ෂා කිරීම.

vi. විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ පවත්වාගෙන යනු ලබන අරමුදල්වල ක්‍රියාකාරිත්වය සමාලෝචනය සහ අධීක්ෂණය.

vii. අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා දෙපාර්තමේන්තුවට අදාල විෂයපථයන් සම්බන්ධයෙන් වන නිරීක්ෂණ මුදල් අමාත්‍යවරයා වෙත ලබා දීම

viii. රාජ්‍ය ප්‍රසම්පාදනයේදී මුදලට සරිලන වටිනාකම, විවෘත හා ඵලදායී තරඟකාරිත්වය, ආචාරධර්ම සහ සාධාරණ ගනුදෙනු, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා භාණ්ඩ, වැඩ සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිසමට සහාය වීම සහ අවශ්‍ය නිර්දේශ ලබාදීම

ix. ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු හා එයට සහාය වන ලංසු ඇගයීමේ කමිටු පත් කිරීම

x. රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම

xi. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට (e-GP) අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම

xii. විදේශ තානාපති කාර්යාල සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින්, තීරු බදු රහිතව මෙරටට ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම.

xiii. රජයේ මූල්‍ය දැක්ම තුළ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්ට සහාය වීම.

1.4. සංවිධාන සටහන

ආයතනික සංවිධාන ව්‍යුහය (2025.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය)



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. මුදල් රෙගුලාසි, පසුවිපරම් හා සමාලෝචන සහ අරමුදල් අංශය
2. ඉඩම් අංශය
3. ප්‍රසම්පාදන අංශය
4. පාලන, ධාරිතා සංවර්ධන සහ පුහුණු අංශය
5. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන අංශය
6. ගිණුම් අංශය

1.6 අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

- අදාළ නොවේ -

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යුරෝපා සංගමයෙන් සහ ප්‍රංශ රජයේ Agence Francaise De Development ආයතනයෙන් ලැබුණු මූල්‍ය ආධාර යටතේ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අතර එමඟින් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-GP) වැඩිදියුණු කර ක්‍රියාත්මක කරනු ලබයි.

(17)

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම (2025)

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ ආයතනවල මූල්‍ය පාලනය පවතින විධිවිධානවලට අනුකූල වීම, වඩාත් යහපත් වූ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යෑම සහ විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම සඳහා සඳහා ප්‍රමුඛ භූමිකාවක් ඉටුකරනු ලබයි. ඒ අනුව, 2025 වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන් අතරින් ප්‍රමුඛ වශයෙන් පහත කාර්යයන් ක්‍රියාත්මක කර ඇත.

රටේ දිගුකාලීන සාර්ව ආර්ථික ස්ථාවරතාවය සහ තිරසාර මූල්‍ය කළමනාකරණය සුරක්ෂිත කිරීමේ අරමුණින් සකස් කරන ලද 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 අගෝස්තු 08 දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදී. එම පනතේ විධිවිධානවලට අනුකූල වීම සඳහා 800 ට වඩා වැඩි මුදල් රෙගුලාසි යාවත්කාලීන කළ යුතු අතර, අවශ්‍ය නොවන මුදල් රෙගුලාසි කිහිපයක් ඉවත් කිරීමත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ ඇතුළත් රාජ්‍ය ආයෝජන කළමනාකරණය සහ මූල්‍ය වගකීම වැනි නව ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා නව රෙගුලාසි මාලාවක් හඳුන්වා දීමත් සිදු කළ යුතු ය. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 67(1) වගන්තිය යටතේ නියම කර ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, මුදල් අමාත්‍යවරයා විසින් රෙගුලාසි සකස් කර නිකුත් කළ යුතුය ඒ අනුව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල සහාය ඇතිව රෙගුලාසි සකස් කරමින් පවතින අතර එම ක්‍රියාවලිය අවසන් අදියරෙහි පවතී.

එසේම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි සමඟ සමගාමීව නියෝග නිකුත් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව අවශ්‍ය නියෝග කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර අනෙකුත් දෙපාර්තමේන්තුවලට අදාළ නියෝග සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කරමින් සිටී. තවද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා එම පනතේ 4(3) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ බලතල භාණ්ඩාගාර ලේකම්වරයාට සහ එම පනතේ 5(2) වගන්තිය යටතේ භාණ්ඩාගාර ලේකම්වරයාට පැවරී ඇති නිශ්චිත බලතල පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන් සහ අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත පැවරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇත.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල් භාණ්ඩාගාර ලේකම් විසින් සුපරීක්ෂණය සිදුකළ යුතු අතර එම පනතේ 39(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එම අරමුදල්වල කාර්යය සාධනය පිළිබඳ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම් විසින් අවම වශයෙන් වසරකට වරක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. එකී අවශ්‍යතාවය සඳහා අවශ්‍ය තොරතුරු කැඳවීම සඳහා සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වෙත 2025.02.28 දිනැති හා අංක 01/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2025.04.11 දිනැති 01/2025

චක්‍රලේඛ ලිපිය නිකුත් කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්තා කර තිබූ තොරතුරු පදනම් කර ගනිමින් 2024 වර්ෂය සඳහා සකස් කරන ලද ව්‍යවස්ථාපිත අරමුදල්වල කාර්යය සාධනය පිළිබඳ වාර්තාව 2025.12.29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලද අතර එම වාර්තාවේ ඇතුලත් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

මීට අමතරව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39(4) වගන්තියේ විධිවිධාන පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමට රජයේ ආයතනවලට හැකියාවක් නොමැති බැවින් මෙතෙක් එම ආයතන විසින් පවත්වාගෙන ආ එවැනි අරමුදල් සම්බන්ධයෙන් සමාලෝචනය කොට භාණ්ඩාගාර ලේකම් වෙත සුදුසු නිර්දේශ ලබාදීම සඳහා අරමුදල් සමාලෝචන කමිටුවක් භාණ්ඩාගාර ලේකම් විසින් පත්කරන ලදි.එම කමිටුව විසින් සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒවාට අයත් ආයතන කැඳවා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා වී තිබූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කරන ලදී. එම කමිටුව ලබාදුන් නිර්දේශ ඇතුළත් 2025.07.02 දිනැති වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2025.08.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත.

එසේම, ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුගතව රෙගුලාසි සහ මගපෙන්වීම් සකස් කිරීම 2025 වර්ෂයේ දී ආරම්භ කරන ලදි. 2026 වර්ෂයේදී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ඒ යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල් භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් සමාලෝචනය කර සුදුසු නිර්දේශ ලබාදීමට කටයුතු කිරීමත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා එක්ව ව්‍යවස්ථාපිත අරමුදල් භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතියට (Treasury Single Accounting System) ඇතුළත් කිරීමට ඇති හැකියාව අනුව කටයුතු කිරීමටත් අපේක්ෂිත වේ.

විවිධ විෂයන් යටතේ ගරු අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දීම මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ හා නිර්දේශයන් ලබා දීම සිදු කරන ලද අතර, 2025 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ 413 ක් සඳහා නිරීක්ෂණද, අමාත්‍ය මණ්ඩල සංදේශ 180 ක් සඳහා නිර්දේශ ද ලබා දී ඇත.

එසේම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටු 01 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සාකච්ඡා සම්මුති කමිටු 13 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටු 02 ක් ද, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන උපදේශක ප්‍රසම්පාදන කමිටු 23 ක් ද, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු 26 ක් ද, ස්ථාවර ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු 12 ක් ද, විචලන සමාලෝචන කමිටු 13 ක් ද, තාක්ෂණ

ඇගයීම් කමිටු 01 ක් ද, ලංසු ඇගයීම් කමිටු 31 ක් ද, ව්‍යාපෘති කමිටු 13ක් ද 2025 වර්ෂය තුළදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කිරීම් සිදු කර ඇත.

අත්හැරීම් සහ කපාහැරීම් විෂය සම්බන්ධයෙන් 2025 වර්ෂයේ දී පහත සඳහන් චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කර ඇත.

(අ) 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන සංශෝධනය කිරීම

මු.රෙ. 113 - වෙනත් අත්හැර දැමීම් සහ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය හා අත්තිකාරම් අත්හැර දැමීම 2025.01.24 දිනැති අංක 01/2024(1) දරන චක්‍රලේඛය

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රජයේ ආයතන විසින් 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 3 වන කොටසෙහි පාඩු හා අත්හැර දැමීම යටතේ කටයුතු කිරීමෙන් අනතුරුව මු.රෙ. 108 (3) යටතේ කපා හැරීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලද අවස්ථා සහ මු.රෙ. 113 යටතේ අත්හැරීමට/අයකිරීමට යොමු කරන ලද අවස්ථා සඳහා 2025 වර්ෂයේ දී ඉල්ලීම් 08 කට අදාළ භාණ්ඩාගාර අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.

විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 2/92 දරන රාජ්‍ය දූත මණ්ඩල චක්‍රලේඛයේ විධිවිධාන පරිදි රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය කිරීමේදී රජයට ගෙවිය යුතු තීරු බදු මුදල පිළිබඳ කටයුතු කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර 2025 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල විසින් අපහරණය කරන ලද වාහන 82ක් සඳහා වූ ආදායම ලෙස රු. 266,626,451.50ක මුදලක් ශ්‍රී ලංකා රේගුව මගින් අය කොට රාජ්‍ය ආදායමට බැර කොට ඇත.

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2024.05.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020(iii) ප්‍රකාරව මහජනයා වෙත සපයන සේවා සඳහා අයකරනු ලබන ගාස්තු සංශෝධනය සඳහා 2025 වර්ෂය තුළ ඉල්ලීම් 14 ක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර ඉන් ඉල්ලීම් 12 කට අදාළව 2025 වර්ෂය තුළ ගාස්තු සංශෝධනය සිදුකරන සිදු කර ඇත.

රට තුල රාජ්‍ය මූල්‍ය පරිහරණයේ කාර්යක්ෂමතාව, වගවීම හා පාරදෘශ්‍යභාව ඉහල නැංවීම හා ඩිජිටල් ක්‍රමවේද හරහා රාජ්‍ය මුදල් වගකීමෙන් යුතුව පරිහරණය කිරීම අරමුණු කොට "ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියක්" නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම හා රජයේ සියලු ආයතන වෙත එය හඳුන්වා දීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ තවත් කාර්යයකි. මේ අනුව, 2019 වසරේ සිට ක්‍රියාත්මකව පවතින "වෙළඳ පොළ මිල සැසඳුම් - Shopping" ක්‍රමවේදය යටතේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන සිදුකිරීම සඳහා http://www.promise.lk වෙබ් පෝර්ටලය මගින් පහසුකම් සපයා ඇති පද්ධතිය තව දුරටත් වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මකව පවතී. 2025 වර්ෂයේදී මෙම පද්ධතිය හරහා ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන 31097 ක් සිදු කර ඇති අතර, 2025 වර්ෂය අවසාන වනවිට රාජ්‍ය ආයතන 835 ක් හා විවිධ

භාණ්ඩ හා සේවා සපයන පුද්ගලික ආයතන 5579 ක් මෙහි ලියාපදිංචි වී ඇත. මෙම ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන සිදුකිරීම හා ඒවායේ තොරතුරු වලට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේද නිර්දේශ පරිදි, රජයේ සියලුම ප්‍රසම්පාදන දැන්වීම පළකිරීමේ ඩිජිටල් අවකාශයක් ලෙස මෙන්ම සියලුම ප්‍රසම්පාදන ප්‍රදාන වල තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමේ ඩිජිටල් අවකාශයක් ලෙසද මෙම පද්ධතිය භාවිතා වේ. ඉදිරියේදී, අනෙකුත් ප්‍රසම්පාදන ක්‍රමවේද භාවිත කර සිදු කරන ප්‍රසම්පාදනයන්ද මෙම ඉ-පද්ධතිය හරහා ඩිජිටල් ආකාරයෙන්ම සිදුකිරීමට පහසුකම් සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ බලාපොරොත්තුවයි.

මීට අදාළව පහත සඳහන් චක්‍රලේඛ සහ චක්‍රලේඛ ලිපි මේ වනවිට නිකුත් කර තිබේ;

i. Implementation of Electronic Government Procurement (e-GP) System in Sri Lanka PFD Circular Letter in reference to the Public Finance Circular No. 08/2019(i) dated 19.04.2023 & Public Finance Circular No. 08/2019(ii) dated 06.02.2024
ii. Implementation of Electronic Government Procurement (e-GP) System in Sri Lanka PFD Letter No. PFD/WEB/Awards(sp)-2024 dated 26.06.2024
iii. Implementation of Electronic Government Procurement (e-GP) in Sri Lanka PFD Circular No 08/2019(ii) dated 06.02.2024
iv. Implementation of Electronic Government Procurement (e-GP) in Sri Lanka PFD Circular Letter in reference to the Public Finance Circular No. 08/2019(i) dated 19.04.2023
v. Implementation of Electronic Government Procurement (e-GP) in Sri Lanka PFD Circular No 08/2019(i) dated 19.04.2023
vi. Implementation of Electronic Government Procurement (e-GP) in Sri Lanka PFD Circular No 08/2019 dated 17.12.2019

ඊ.ඒ. රත්නසීල
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

03. පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		94,080,000	89,129,000	ඒසීඒ-3
-	තැන්පතු		62,333	389,152	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,801,442	6,056,482	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**100,943,775**	**95,574,634**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**100,943,775**	**95,574,634**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		1,541,258	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**99,402,517**	**95,574,634**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
88,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	81,385,430	67,134,233	ඒසීඒ-2(ii)
29,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	22,731,294	23,680,693	ඒසීඒ-2(ii)
1,750,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,047,344	1,074,478	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
119,250,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**105,164,068**	**91,889,404**	
	මූලධන වියදම්				
1,400,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	368,688	428,000	ඒසීඒ-2(ii)
600,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	516,020	4,865,817	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
1,000,000	හැකියා වර්ධනය	14	713,020	496,000	ඒසීඒ-2(ii)
410,000,000	වෙනත් මූලධන වියදම්	15	103,311,498	75,283,989	ඒසීඒ-2(ii)
413,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**104,909,226**	**81,073,806**	
	තැන්පතු ගෙවීම්		62,333	389,152	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		9,214,042	5,270,504	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**9,276,375**	**5,659,656**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**219,349,669**	**178,622,866**	
532,250,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(119,947,152)**	**(83,048,232)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(119,947,152)	(83,048,232)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(119,947,152)	**(83,048,232)**	

20/02/2026

පී.කේ. චරාෂා හංසිනී
රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01. 1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	66,812,520	64,004,968
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	11,221,231	8,808,631
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**78,033,751**	**72,813,599**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		11,221,231	8,808,631
දේපළ පිරියත හා උපකරණ සංචිතය		66,812,520	64,004,968
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**78,033,751**	**72,813,599**

පිටු අංක 07 සිට 29 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 36 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2026.02.27	දිනය :2026.02.27	දිනය :2026.02.20
ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය කොළඹ - 01	පී.ඒ. රත්නසීල රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.	පී.කේ. එරාෂා හංසිනී රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	15,272,393	9,961,749
අග්‍රිම ලැබීම්	94,080,000	89,129,000
අත්තිකාරම් අයකර ගැනීම්	7,958,654	4,949,201
තැන්පතු ලැබීම්	62,333	389,152
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**117,373,380**	**104,429,102**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	103,865,574	90,533,951
සහනාධාර සහ මාරුකිරීම්	1,047,344	1,074,478
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	1,759,728	6,458,117
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	267,493	795,897
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,541,258	-
අත්තිකාරම් ගෙවීම්	8,829,651	5,177,507
තැන්පතු ගෙවීම්	62,333	389,152
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**117,373,380**	**104,429,102**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	-	-
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

20/02/2026

පී.කේ. එරාෂා හංසිනී
රාජ්‍ය මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

6

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
		අදාළ නොවේ			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	119,250,000.00	119,250,000.00	105,164,068.00	88.19%
ප්‍රාග්ධන	413,000,000.00	413,000,000.00	104,909,226.00	25.40%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		අදාළ නොවේ				

3.8 **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	3,956,900.00	3,956,900.00		100%
9152	යන්ත්‍රෝපකරණ	62,855,620.06	62,855,620.06		100%
9153	ඉඩම්	-	-		-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරීගෙන යන වැඩ	-	-		-
9180	බදු දෙන ලද වත්කම්	-	-		-
		66,812,520.06	**66,812,520.06**		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

20

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/E/DPF/FS/25/25

ඔබේ අංකය / உமது இல. / Your No.

RECEIVED 05 JUN 2026 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

දිනය / திகதி / Date 2026 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදි ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුව, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඇමුණුම III හි සඳහන් බැරකම් හා බැඳීම්, ඇමුණුම IV හි මු.රෙ. 94(2) සහ 94(3) ප්‍රකාරව බැඳීම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය තුළ ද දක්වා තිබුණි. ඒ හේතුවෙන් මු.රෙ. 94(2) හා 94(3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් හා බැරකම් ඇතුළත් කර ඇමුණුම IV සකස් කර නොතිබුණි.

3.2 නීතිරීති හා රෙගුලසිවලට අනුකූල වීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 ප්‍රකාරව, රජයේ වාහන සඳහා සෑම ඉන්ධන දහනය පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙන් කළ වාහන 03 ක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂාව කිසිදු වර්ෂයක් තුළදී සිදුකර නොතිබුණි.

3.3 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව, බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත්, අංක 014-1-001-4-9026099 දරන බැංකු ගිණුම ආරම්භ කළ 2024 මාර්තු මස සිට 2026 මාර්තු 31 දින දක්වා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

(ආ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක 014-1-001-4-9026099 දරණ ගිණුම යටතේ ඇති පෙර ගෙවුම් කාඩ්පත් ගිණුමේ 2025 දෙසැම්බර් 31 දිනට පැවතුණු රු.58,250 ක ශේෂය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි II කොටසෙහි 1.4 හා 1.5 යටතේ ඇති මාර්ගෝපදේශ අංක 09 ප්‍රකාරව, ආයතනයේ නිල බැංකු ගිණුමට එනම්, අංක 014-1001-8-9026097 දරන ගිණුමට මාරු කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39(4) වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අරමුදල් සමාලෝචන කමිටුව විසින් 2025 ජූලි 02 දින ප්‍රකාශයට පත් කළ කමිටු වාර්තාව අනුව,

(i) ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට නිර්දේශ කර,අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 6 ක 2024 දෙසැම්බර් 31 දිනට ශේෂයන්හි එකතුව රු.මි. 3,483.72 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර වීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

(ii) ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 23ක් වසා දැමිය යුතු බවට නිර්දේශ කර තිබුණු අතර, මෙම අරමුදල් අතරින් අරමුදල් 3 ක කටයුතු පමණක් අවසන් කොට වසා දැමීමේ කටයුතු 2026 මාර්තු 31 දින වන විට අවසන් කර තිබුණ ද, ඉතිරි අරමුදල් 20 හි කටයුතු අවසන් කර නොතිබුණි. මෙම වසා නොදමන ලද අරමුදල් අතර පැවති වාහන වායු විමෝචන භාරකාර අරමුදල වසා දැමීමට, 2017 වර්ෂයේදී පැවති අරමුදල් සමාලෝචන කමිටුව මගින්ද නිර්දේශ කර තිබුණි.

(iii) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත අරමුදල් තුනක් වසා දැමීම හා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ ශේෂය ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට නිර්දේශ කර තිබුණ ද, 2026 මාර්තු 31 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණු අතර, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලෙහි ශේෂය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ආ) විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධනය

(i) විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධනය සඳහා ගිවිසුම්ගත වූ පද්ධති සංවර්ධක කොළඹ විශ්ව විද්‍යාලය යටතේ ක්‍රියාත්මක නොවන ස්වාධීන සමාගමක් බව කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමිය විසින් 2019 ජුනි 17 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත් කර තිබුණි. පද්ධති සංවර්ධක තෝරා ගැනීමේදී 2007 උපදේශකවරුන් තෝරා ගැනීම හා සේවය ලබා ගැනීම සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.13.1(d) වගන්තිය ප්‍රකාරව තනි ප්‍රභවයක් තෝරා ගැනීමේදී අදාළ කාර්යයට සුදුසුකම් ලබා ඇති එකම හෝ අදාළ පැවරීම සඳහා සුවිශේෂී අත්දැකීම් ඇති හා උපදේශක සේවා සපයන සංවිධානයක් වේ නම් පමණක් මෙම ක්‍රමය යොදා ගත හැකි බව දක්වා තිබුණි. ඒ අනුව කටයුතු නොකර තනි ප්‍රභවයක් තෝරා ගැනීමේ පදනමට කොළඹ විශ්වවිද්‍යාලයට

සම්බන්ධිත ආයතනයක් ලෙස හඳුන්වමින් තීක්ෂණ සමාගම (ඇපයෙන් සීමිත) වෙත ඉහත පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමටත්, ඒ සඳහා ගිවිසුමකට එළැඹීමටත් 2019 ජුනි 19 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2019 නොවැම්බර් 25 දින කොන්ත්‍රාත්තුව සඳහා පද්ධති සංවර්ධක ආයතනය සමඟ ගිවිසුම්ගත වී තිබුණි. එම ගිවිසුම් ගතවීම 2019 නොවැම්බර් 25 දින සිදු කර තිබුණද, වසර 02 ක් ගතවී 2021 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. මෙම පද්ධතියේ නව අනුවාදයන් නිර්මාණය සඳහා මුල් කොන්ත්‍රාත් වටිනාකමට රු.81,370,000 ක් ඇතුළත් කර රු.152,870,000 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 20 ක කාලයක් තුළ පද්ධතිය සැකසීම සඳහා උක්ත කොන්ත්‍රාත් සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි. තවද, පද්ධති සංවර්ධක විසින් ගිවිසුම්ගත බැඳීම් කිහිපයක් පිළිනොපැදීම, e-GP Modules ලබා දීමේදී නිරන්තර ප්‍රමාද පැවතීම, ලිපි සඳහා ප්‍රතිචාර නොදැක්වීම හා Deliverables ලබා දීමට ඉල්ලීම් කළ ද ඒවා ලබා නොදීම ආදී කරුණු හේතුවෙන් 2025 අගෝස්තු 29 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පද්ධති සංවර්ධක සමඟ පැවති ගිවිසුම අවලංගු කර, 2026 වර්ෂයේදී නව පද්ධති සංවර්ධක ආයතනයක් සමඟ ගිවිසුම් ගතවීමට මිල කැඳවීම් සිදු කර තිබුණි. මුල් කොන්ත්‍රාත්කරු සමඟ අතිරේකයක් අත්සන් කිරීමට පෙර නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබීම විගණනයේදී ගැටලුකාරී විය.

(ii) විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ Version 3 තුන්වන පාර්ශවීය ස්වාධීන තහවුරුකරු වන පෞද්ගලික ආයතනයක් වෙත තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර, ඒ සඳහා ගෙවීම් ලෙස එකතුව රු.4,398,538 ක් 2025 වර්ෂයේදී එම පෞද්ගලික ආයතනය වෙත ගෙවීම් කර තිබූ අතර, Version 3 ක්‍රියාත්මක තත්ත්වයට සංවර්ධනය කර නොමැති බව එම ආයතනය විසින් තහවුරු කර තිබුණි.

(iii) Rainbow Pages හි සඳහන් වන ලියාපදිංචි සැපයුම්කරුවන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා සාකච්ඡා සිදු කර අවසන් වුවද, 2025 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඒකාබද්ධ කිරීම සිදු කර නොතිබුණි. පද්ධතියේ ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රතිචාර නොදැක්වීම ආදී ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් මෙම පද්ධතියේ ලියාපදිංචි රාජ්‍ය ආයතන 879 කින් 361 ක් පමණක් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හරහා තම ආයතනවල ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි.

(iv) විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය පිළිබඳ උපදේශක ප්‍රතිපෝෂක සහ උපායමාර්ගික මගපෙන්වීම සඳහා වාර්තාව හා 2025 ජූලි 16 දින පැවති Steering Committee Meeting – VI හිදී සාකච්ඡා කරන ලද World Bank Mission Report හි විශේෂිත කරුණු අනුව, පද්ධති සංවර්ධක ආයතනය විසින් පද්ධති සංවර්ධන නිලධාරීන් ප්‍රමාණවත් පරිදි e-GP පද්ධතිය සංවර්ධනය සඳහා යොදවා නොතිබුණි. එම තත්ත්වය නිවැරදි කර අනුමත මානව සම්පත් සැලැස්මට අනුව

නිලධාරීන් පද්ධති සංවර්ධනය සඳහා යෙදවීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද, එම තත්ත්වය නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(v) රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමෙහි සාමාන්‍ය ගිවිසුම් කොන්දේසිවල 3.8.1 හි Payments of Liquidated Damages වගන්තිය ප්‍රකාරව පද්ධති සංවර්ධකගේ ප්‍රමාද වීම් සඳහා දිනකට අදාළ Sprint/ Phase සඳහා ගෙවන මුදලින් සියයට 0.07142 ක අනුපාතයක් වන පරිදි ප්‍රමාද ගාස්තු අය කිරීම සිදු කළ යුතු බව සඳහන් කර තිබුණි. විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සංවර්ධන සැලැස්ම තුළ Sprint 01 හා 02 2023 සැප්තැම්බර් 30 අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද, එය 2024 වර්ෂයේදී අවසන් කර තිබුණු අතර, එම ප්‍රමාදයන් සඳහා 2025 දෙසැම්බර් 31 දින වන විටත් පද්ධති සංවර්ධකගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) මිල සැඳහුම් ක්‍රමය යටතේ පමණක් විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා e-GP පද්ධතිය සංවර්ධනය කර ඇති බැවින්, දේශීය හා විදේශීය අරමුදලින් 2019 වර්ෂයේ සිට එකතුව රු. 269,508,751 ක වියදමක් දරා තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂිත අරමුණ වූ රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල ආයතනික ධාරිතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

4.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

මු.රෙ. 880 (i) ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරය වන රජයේ ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, නිලධාරීන් 7 දෙනෙකු විසින් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව, තත්‍ය සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	30	19	11
තෘතියික මට්ටම	02	01	01
ද්විතියික මට්ටම	42	32	10
ප්‍රාථමික මට්ටම	16	10	06
	90	**62**	**28**

ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරුවලින් සියයට 30 ක් පුරප්පාඩුව පැවතීම හා එම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රාජ්‍ය අංශයේ ගනුදෙනුවල විනිවිදභාවය හා වගවීම තහවුරු කිරීම පිණිස මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රමපද්ධති හා පටිපාටීන් සැකසීම, සංවර්ධනය, සමාලෝචනය, පසුවිපරම සහ යාවත්කාලීන කිරීම සඳහා වන නියාමු ආයතනයක් වන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අරමුණ ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීමට අහිතකර ලෙස බලපෑ හැකිය.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
උපදෙස් ලබා දීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ නිකුත් කිරීම	√		
දෙපාර්තමේන්තුව වෙත යොමු කළ පැහැදිලි කිරීම් සඳහා පිළිතුරු සැපයීම	√		
සහභාගී වූ රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් සංඛ්‍යාව	√		
ගිණුම්කාරක සභාවේ මඟ පෙන්වීම් පසු විපරම් කිරීම	√		
භාණ්ඩාගාර සටහන් නිකුත් කිරීම	√		
විගණකාධිපති වාර්තා නිරීක්ෂණ සම්බන්ධව පසු විපරම් කටයුතු	√		
රජයේ ගාස්තු හා අයකිරීම් සංශෝධනය	√		
පාඩු හා කපා හැරීම් සඳහා වන ඉල්ලීම් සඳහා නිර්දේශ සැපයීම	√		
රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් භාවිතා කරන ලද වාහන අපහරණය	√		
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම	√		
ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම්	√		

කමිටු හා ව්‍යාපෘති කමිටු පත් කිරීම			
මූල්‍ය ප්‍රකාශන, වාර්තා නියමිත කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කිරීම	√		

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
සියල්ලන් සඳහාම පෝෂිත, සර්වග්‍රාහී හා තිරසරාත්මක ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සැමට යහපත් ජීවනෝපායක් ප්‍රවර්ධනය කිරීම	සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දිරිගැන්වීම	2024 අංක 24 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත බලාත්මක කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා උපදෙස් චක්‍රලේඛ නිකුත් කිරීම, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල සහාය ඇතිව රෙගුලාසි සකස් කිරීම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ මූල්‍ය පාලනයට අදාළ වන රෙගුලාසි සකස් කිරීමේ මධ්‍යගත කාර්යභාරය ඉටුකරන ආයතනය වන අතර රාජ්‍ය අංශය තුළ මූල්‍ය භාවිතයේ විනිවිදභාවය, වගවීම වර්ධනය කරමින් යහපත් රාජ්‍ය මූල්‍ය විනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය පසුතලය නිර්මාණය කිරීමේ වගකීම සතු ආයතනයයි. රාජ්‍ය ආයතනවලින් සිදුවන ප්‍රසම්පාදන කාර්යයන්වලදී ඒවායේ විනිවිදභාවය හා වගවීම ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධව කටයුතු කරන අතර දරිද්‍රතාවය පිටුදැකීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම පිණිස සැලකිය යුතු දායකත්වයක් සපයයි.

තවද, පාර්ලිමේන්තුව වැනි ආයතනවලට වගවීම සම්බන්ධයෙන් විධිමත් පාලනයක් පවත්වාගෙන යාමට සහාය වෙමින් නෛතික පාලන ක්‍රමවේද ප්‍රවර්ධනය කරමින්, තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට පසුතලය සකස් කරමින්, රාජ්‍ය ආයතන තුළ වන නියාමනයන් හා මූල්‍ය උපදේශාත්මක සේවාවන් සපයනු ලබයි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	30	19	11
තෘතීයික	02	01	01*
ද්විතියික	42	32	10*
ප්‍රාථමික	16	10	06*
වෙනත්/ අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්	0	0	0
එකතුව	**90**	**62**	**28**

- ❖ භාෂා පරිවර්තක නිලධාරිනිය 2024.11.13 දින සිට 2029.04.04 දින දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත.

- ❖ සංවර්ධන නිලධාරිනියක් වැටුප් රහිත විදේශීය නිවාඩු 2023.01.20 දින සිට 2028.01.19 දින දක්වා ද, සංවර්ධන නිලධාරිනියන් දෙදෙනෙක් වැටුප් රහිත දේශීය නිවාඩු 2024.01.02 දින සිට 2029.01.01 දින දක්වා හා 2025.06.01 දින සිට 2030.05.31 දින දක්වා ද, කළමණාකරන සේවා නිලධාරියෙක් වැටුප් රහිත දේශීය නිවාඩු 2025.06.01 දින සිට 2030.05.31 දින දක්වා ද ලබා ඇත.

- ❖ කා.සේ.සේ. එක් සේවක මහත්මියක් 2023.01.17 දින සිට 2028.01.16 දින දක්වා වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ඇත.

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ආයතනික අරමුණු හා අභිමතාර්ථ සාර්ථකව සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත නිසි ලෙස කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වන අතර, ප්‍රතිපත්ති සැකසීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත සතුව පවතින ශක්‍යතාවයන් මනාව කළමනාකරණය කර උපරිම ප්‍රයෝජනයට ගැනීම මගින් දෙපාර්තමේන්තු අරමුණු හා අභිමතාර්ථ සඵල කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

Name of the Program	No. of Staff Trained	Duration of the Program	Total Investment (RS)	Nature of the Program(Foreign/Local)	Output/ Knowledge gained
A Certificate course on English Language	All Dos & MSOs of PFD	6 months	260,000.00	Local	
Master of Public Financial Management (SLIDA)	DD-01 Dos-03	01 year	-	Local	
Demystifying AI & Agentic AI	DD-02	3 hours session	-	Local	
46th National Conference of Charted Accountants	D-01 DD-01	3 days	70,000.00	Local	
Staff Motivation Program	All Officers of PFD	2.5 Hours	25,220.00	Local	

Certificate in English for Careers	AO-01 DO- 04 MSO-01	6 months	276,000.00	Local	
Training on Public Financial Management Act	All Officers of PFD	01 day	81,800.00	Local	
ADB Roundtable Discussion and Knowledge Sharing Event : The Road to $1.3 Trillion: Asia and the Pacific Dialogue on Climate Finance	Mr. E.A. Rathnaseela/ DG	03 days	-	Foreign	
5th Asia Finance Forum- Positioning for the Future	Mr. D.Thushara F. Suraweera/ ADG	6 days	-	Foreign	
Seminar on Construction and Management of Development Zone for Sri Lanka	Ms. G.C.N.Fonseka/ADG	15 days	-	Foreign	
IMF: Digital Horizons: Transforming Public Financial Management for Tomorrow High- Level Forum	Mr. R.S.K.Doolwalage/ ADG	2 days	-	Foreign	
IMF: SARTTAC Training on Fiscal Risk Management,	Ms. A.M.S.Malkanthi/ ADG	5 days	-	Foreign	
Seminar on Public Financial Management for Sri Lanka	Ms.N.H.W.Nandani de Alwis/D	14 days	-	Foreign	
	Ms.D.M.S. Devagiri/D		-	Foreign	
Seminar on Blue Economy Think Tank Network for Indian Ocean Rim” from 5th to 25th September 2025, China	Ms. H.D.N.K. Hettiarachchi/ D	21 days	-	Foreign	
Seminar for Young Diplomats from the	Ms. K.G.S. Maduwanthi/ DD	14 days	-	Foreign	

Democratic Socialist Republic of Sri Lanka	Ms. A.D.D. Tharaka/AD		-	Foreign	

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

රාජ්‍ය සේවයට පොදු කරුණු සම්බන්ධ පුහුණුව සහ අත්දැකීම්වලින්ද යුතු කාර්යමණ්ඩලයක් පවත්වා ගැනීම දෙපාර්තමේන්තු කාර්යසාධනයට සෘජු හා සාධනීය බලපෑමක් ඇති කරයි. එමෙන්ම, සමස්ථ රාජ්‍ය යාන්ත්‍රණය ඩිජිටල්කරණය සමඟ අනාගතයට ගෙන යාමත්, ගෝලීය ආර්ථික තත්ත්වයන් හඳුනාගෙන රාජ්‍ය යාන්ත්‍රණය කාර්යක්ෂමව මෙහෙයවීමත් සඳහා ඒ සම්බන්ධ දැනුම හා ධාරිතාව කාර්යමණ්ඩලය තුළ වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙවන් පසුබිමක් තුළ සේවක අභිප්‍රේරණය වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කාර්යමණ්ඩල සංවර්ධනයට හා ආයතනීය කාර්යසාධනය ඉහළ නැංවීමට මහඟු දායකත්වයක් ලබා දෙයි.

07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			

6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම	අදාළ නොවේ		

	මු.රෙ. 772 අනුව සිදු කිරීම			
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			

12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ	අනුකූල වේ		

	කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන්	අනුකූල වේ		

	මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		